ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 10 කාණ්ඩය 2 2013 දෙසැම්බර්

TEA RESEARCH INSTITUTE OF SRI LANKA
20 DEC 2014
LIBRARY

## මාතර දිස්ත්‍රික්කයේ සාර්ථකත්වය කරා ගමන්කල ප්‍රමිතියෙන් යුත් තේ තවාන් පැළ නිපදවීමේ වැඩසටහන

මාතර දිස්ත්‍රික්කයේ තේ වගාකරුවන් සිය අලුත් සහ නැවත වගාවන් සඳහා අවශ්‍ය තේ පැළ වලින් සැළකියයුතු ප්‍රමාණයක් සපයා ගත්තේ රත්නපුර සහ ගාල්ල දිස්ත්‍රික්ක වල වාණිජ තේ තවාන් කරුවන්ගෙනි. මාතර දිස්ත්‍රික්කයේ තේ පැළ නිෂ්පාදනයේ පැවති උණාතාවය හේතුවෙන් මෙලෙස පිට පළාත් වලින් තේ පැළ මිලදී ගත්තද වගාකරන පැළ බොහෝමයක ප්‍රමිතිය ඉතා දුර්වල මට්ටමක පවතින බව අනාවරණය විය. විශේෂයෙන්ම භාවිත කර ඇති පොලිතීන් මලු අඟල් 3 4 අතර අඩු උසකින් යුක්ත විය. මීට අමතරව ඇතැම් තවාන් කරුවන් බිම් පැළ නිෂ්පාදනය ද සිදුකල අතර ඒවා මිටි වශයෙන් බැඳ පොළ භූමිවල අලෙවිකරන තත්වයක්ද දක්නට ලැබිණි. මේ ආකාරයෙන් නිපදවන තේ පැළවල නිෂ්පාදන වියදම ඉතාමත් අඩුවූ හෙයින් ඒවායේ විකුණුම් මිලද රු. 8 - 10 අතර වූ බැවින් එම තේ පැළ, වගාකරුවන් අතර සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට හේතු වී තිබිණි. ප්‍රමිතියෙන් අඩු, දුර්වල තේ පැළ සිටවූ වගාකරුවන්ගේ තේ වගාවන් බොහෝමයක් අසාර්ථකව වී තිබුණි. දෙනියාය ප්‍රදේශයේ උද්ගත වී තිබෙන තේ පඳුරු දුර්වල වීමේ තත්වය පිළිබඳව සිදුකල සමීක්ෂණයේදී අනාවරණයවූ එක් කාරණයක්වූයේ, මෙම දුර්වල තේ පැළ වගා කිරීමෙන් පසු කාලීනව තේ පඳුරු දුර්වලවීමට හේතු වී තිබුණු බවයි.



2011,2012 වර්ෂවල දෙනියාය, ප්‍රාදේශීය උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසදයන්හිදී තේ පර්යේෂණ ආයතනයේත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහ තේ සංවර්ධන සමිති වල නිළධාරීන් එක්ව සාකච්ඡා කිරීමෙන් ඇතිකරගන්නා ලද එකඟතාවයට අනුව මාතර දිස්ත්‍රික්කයේ සිටින වාණිජ තේ තවාන්කරුවන් ශක්තිමත්කර තේ තවාන් පාලනයට අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදෙස් ලබාදී මාතර දිස්ත්‍රික්කයේ තේ පැළ අවශ්‍යතාව සපුරාලීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුත් තේ පැළ නිපදවීමට ක්‍රියාකාරී වැඩසටහනක් ආරම්භ කරන ලදි. මෙම වැඩසටහනේ එක් ප්‍රධාන ඉලක්කයක් වූයේ 2012 - 2013 වසර කාලය තුල මාතර දිස්ත්‍රික්කය තුල උසස් ගුණාත්මයෙන් යුතු තේ පැළ නිෂ්පාදනය ලක්ෂ 12 දක්වා ඉහළ නැංවීමය. මේ සඳහා වාණිජ තේ තවාන් කරුවන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් ගණනාවක් දිස්ත්‍රික්කය පුරා පවත්වන ලදි. මව් අතු සපයාගත හැකි ස්ථාන සම්බන්ධීකරණය කරදෙන ලදි. පැළ නිපදවූ පසු ඒවා අලෙවිකර ගැනීම සඳහා යම් ආකාරයක වැඩපිළිවෙලක් ද සකසා දෙන ලදි.



තේ තවාන්කරුවන් බොහෝ දෙනෙක් උසස් ප්‍රමිතියෙන් යුත් පැළ නිපදවීමට යොමු නොවන්නේ ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය සාපේක්ෂව අධික වීමත්, සුදුසු පස් සපයා ගැනීමේ දුෂ්කරතා සහ පැළ අලවිකර ගැනීමේ ඇති දුෂ්කරතාත් නිසාය. නමුත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසු 2013 ජූනි මාසය වන විට මාතර දිස්ත්‍රික්කය තුල නිපදවීමට හැකිවු තේ පර්යේෂණ ආයතනය නිර්දේශකරන සම්මතයන්ට අනුකූල ගුණාත්මක තේ පැළ සංඛ්‍යාව ලක්ෂ 8 1/2 ද ඉක්මවා තිබුණි. මෙම එක් තේ පැ, නිපදවීමට රු. 15 - 17 ත් අතර මුදලක් වැයවූ අතර රු. 20 - 25 ත් අතර මුදලකට එම පැළයක් අලෙවි කල හැකිවිය.

කුඩා තේ වතු ආශ්‍රිත වාණිජ තේ තවාන් කරුවන්ගේ තත්වය වැඩි දියුණු කිරීමට හා අලුතින් වාණිජ තේ තවාන් ඇරඹීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක නිළධාරීන් විශාල කාර්යභාරයක් ඉටුකරන ලදි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව පැරණි දියදාව තේ පර්යේෂණායතන භූමියේ පැවති තේ තවාන වැඩි දියුණු කර වාණිජ තේ තවානක මට්ටමට ගෙන එන ලදි. තේ පර්යේෂණ ආයතනයේ ඍජු මැදිහත්වීම යටතේ, ප්‍රදේශයේ වතු සමාගම් කිහිපයක ද (කිරුවානාගඟ වත්ත, හැන්ෆර්ඩ් වත්ත, දෙනියාය වත්ත) තිබුණු තේ තවාන් වැඩි දියුණු කරන ලදි. දිස්ත්‍රික්කයේ ඇතැම් තේ කර්මාන්ත ශාලා තේ පර්යේෂණ ආයතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව සිය දලු සපයන කුඩා තේ වතු හිමියන්හට වාරික 3 කින් පමණ මුදල් ගෙවීමේ සහනදායී ක්‍රමවේදයක් යටතේ පැළ ලබා දීමේ වැඩටහන් ද ක්‍රියාත්මක කරනු ලැබීණ. මෙහිදී තේ පැළ අදාල ස්ථාන ) ප්‍රවාහනයකර දෙනු ලබන අතර මෙය ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියංාට ඉතාමත් සහනදායී වැඩපිළිවෙලක් බවට පත්ව තිබේ.



ශිෂ්‍ය ප්‍රමිතියෙන් යුතු තවාන් පැළ සාර්ථක වගාවක පදනමයි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි සාර්ථකත්වය පිළිබඳව තේ තවන්කරුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර මත මෙම වැඩසටහන තව

7 වැනි පිටුවට

**එස්. පී. රත්නායක - තේ පර්යේෂණ ආයතනය**
**ජී. ජී. බන්දුල - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 10 කාණ්ඩය 2 2013 දෙසැම්බර්

TEA RESEARCH INSTITUTE OF SRI LANKA
20 DEC 2014
LIBRARY

දුරටත් පවත්වා ගෙන යමින් 2014 වර්ෂය අවසානයේදී තේ පැළ ලක්ෂ 12ක් නිපදවීමේ ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන තුලින් මාතර දිස්ත්‍රික්කයේ දුර්වල තත්වයක පැවති වාණිජ තේ තවාන්කරුවන්ගේ තත්වය ඉහළ මට්ටමකට ගෙන එමින් හා ගුණාත්මක පැළ නිපදවීමට හැකිවූ අතර දිස්ත්‍රික්කයේ තේ වගාකරුවන් හට තම ප්‍රදේශයෙන්ම උසස් ප්‍රමිතියෙන් යුත් තේ පැළ ලබාගැනීමට අවස්ථාව උදාවී ඇත. [redacted]